# මට හරි සතුටුයි



එවින්යා ආල්වීර

මට හරි සතුටුයි

එවින්යා ආල්වීර

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය -2023

ISBN 978-624-206-689-9

**කර්තෘගේ වෙනත් කෘති**

උපන්දින තෑග්ග

# පිදුම

**මාගේ ආදරණීය දෙමව්පියන්ද**

**දයාබර අයියා තේමිත**

**අක්කා හෙසන්යා සහ**

**ආදරණීය අත්තම්මාට සහ අත්තාටත්**

**මාගේ ගුරුවරුන්ටත්**

**පුදමි.**

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාජෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය  මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන  විද්‍යුත්  පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානයක “දිවිය දිනන විද්‍යුත්  පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# මට හරි සතුටුයි


එයා හරිම ලස්සන සුදුම සුදු බලු පැටියෙක්.පුංචි සුදු පාට ඇස් දෙකක් එයාට තියෙනවා.කන් දෙක හරිම චූටියි.



එයාගේ අම්මාගේ නම ලැසී.කොයි වෙලාවේ බැලුවත් ලැසී ඉන්නෙම එයාගේ සුදූ ළඟමයි. හරියට මේ පුංචි පැටියව කවුරුහරි අරගෙන යයි වගේ.



දැන් සුදූ ට දුවන්න පුළුවන්. දුවගෙන යන වෙලාවට මේ පුංචි පුළුන් බෝලය අල්ලගන්නමයි හිතෙන්නේ. ඒත් එයාගේ අම්මා බලගෙන ඉන්නේ සුදූ දිහාමයි.අනේ ඉතින් මට එයාව අල්ලන්නම බෑ.



දවසක් දා සුදූගේ අම්මා මේ පැටියට අලුත් ගෙදරක් හදලා. මිදූලේ ගුහාවක් හාරලා මේ පැටියව තියාන ඉන්නවා.අපිට ලඟට යන්න දෙන්නෙවත් නෑ.



එදා අපේ ගෙදරට ලොකු වැස්සක් ආවා. සුදූ ඉන්න වල වතුරෙන් පිරුණා. අක්කාටත්, අයියාටත්, මටත් පුදුම බයක් දැනුනේ.වැස්ස එන්න එන්නම වැඩිවුණා. ගොරවන්නත් ගත්තා. අපි ජනේලය ලගට ගිහින් බැලුවා. වතුර හොඳටම වැඩි. සුදූ වතුරට යටවෙයිද කියලා මට හරියට දුක හිතුණා.



අපි ඔක්කෝමලා අම්මාට කතා කළා.අම්මා ඇවිත් බලලා තෙමි තෙමීම පුංචි සූදුව ගොඩට ගත්තා. මට හරිම සතුටුයි. අනේ හැබැයි දැන් නම් එයා දුඹුරුම දුඹුරු පාටයි. දුවලා ගිහින් අම්මාට මම රෙදි කැල්ලක් ගෙනත් දුන්නා. අම්මා ඉක්මනින් අපේ සූදුව පිස දැම්මා. එයා දැන් හරිම සතුටින්. අපේ අම්මා සූදූව ඉක්මනින් ලැසී ලග තිබ්බා. බොහොම අහිංසකව එයා මන් දිහා බැලුවා. මගේ සතුට තවත් වැඩි වුණා.

## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට

පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය භික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01